## 2019 පෙබරවාරි මස සංඝ පවුල් දින සුපුවත
### දේව රාජ්‍යයම වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
### එය ප්‍රකාශ කිරීමේ සුදුසුම පුතණුවන් ද වූ සේක.

01. ආරම්භක ප්‍රශංසාව: පුබුදු ගී අංක 11 "සුදතුම් මංගලයි.....

02. ප්‍රශංසාවට හැදින්වීම :

2 කොරින්ති 5:16-17,21

**".... එබැවින් යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත. දැන් සියල්ලම අලුත් වී තිබේ."**

**"දෙවියන් වහන්සේ පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා මනුෂ්‍ය පාපී බව හා සම වීමට සැලසූ සේක. එසේ කළේ ක්‍රිස්තුන් වහන්සේ කරණකොට ගෙන දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකමට අප පංගුකාරයන් වනු පිණිසය."**

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ජීවිතයේ ස්වාමියාණන් ලෙස පිළිගෙන ජීවත් වන්නට කැඳවීම ලත් ජනතාවක් ලෙස අප ලබා ඇති භාග්‍යවන්තකම ගැන දෙවි මහෝත්තමයාණන් පැසසීම අප සතු පරම යුතුකමකි. ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමෙන් අප ලබා ඇති නවතාවය, අලුත් බව ඔවුන් වහන්සේව හිමිකරගෙන ජීවත් වීමේ ප්‍රතිඵලයක්ම නොවන්නේද? අප සතු මනුෂ්‍ය පාපි බවින් අපව ධර්මිෂ්ඨකමට පමුණුවන්නට පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේට මනුෂ්‍ය පාපි බව හා සම වන්නට දෙවියන් වහන්සේ විසින් සලසනු ලැබුවේද ඔවුන් වහන්සේ අප වෙත දක්වන්නාවූ අසීමිත ප්‍රේමය නිසාමය. අපේ දුබලකම, පාපය නොතකා සදාතනික ප්‍රේමයකින් අපට ප්‍රේම කරන මහෝත්තම වූ දෙවිඳාණන් ඉදිරිපිට මනස්ථාපනය වෙමින් අප වෙත දක්වන්නාවූ දයාකරුණාව වෙනුවෙන්ද දෙවිඳුන් පසසමු.

පුබුදු ගී අංක 134 - "පරම අපරිමිත ...."

03. ආපසු බැලීම:

i ශුද්ධාත්ම ස්නාපන රැළියත් සමඟ ඔබ ලැබූ බලගතු ශුද්ධාත්ම ස්නාපනය පසුගිය මාසය පුරාම ඔබ ජීවිත තුළ අත්දුටු අයුරු බෙදා ගන්න.

ii දේව රාජ්‍යය මුල්කරගෙන ඔබ තුළ ඇවිළුණු ශුද්ධාත්ම ගින්නෙන් දැවෙමින් දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට යම් පියවරක් ඔබට ගත හැකි වීද?

04. දවසේ සුපුවත : **1 වන කොටස** - ශු. මතෙව් 3:2

### දේව රාජ්‍යය වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ

දේව රාජ්‍යය යනු දෙවියන් වහන්සේගේ පාලනය, දේව කැමැත්ත මෙලොවෙහි ඉටුවීමයි. ශු. මතෙව් ශුභාරංචියට අනුව දේව රාජ්‍යය යන යෙදුම වෙනුවට ස්වර්ග රාජ්‍යය යන යෙදුම භාවිතා කොට ඇත. ස්වර්ග රාජ්‍යය නොහොත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය යන තේමාව ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීමෙහි ප්‍රධාන තැනක් ගනියි. ශුභාරංචිවල රාජ්‍යය යන්නෙන් අදහස් කරන්නේ රාජධානියක් නොව රජකම් කිරීම හෙවත් පාලන බලය පැවැත්වීමය. එය යම් ක්ෂේත්‍රයක් තුළ ස්වාධිපත්‍යය පැවැත්වීම නොව, රාජ්‍යය පිළිබඳ සිද්ධාන්තය ක්‍රියාවට නැංවීමයි. මෙයින් අදහස් වන්නේ ලෝකය තුළ කෙරෙන සියල්ල කෙරෙහි දෙවියන් වහන්සේගේ පාලන බලය පැවතීමයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ උපතේ සිට අවසානයේ කුරුසියේ මරණය දක්වාත් ඉනුත් නොනැවතී උත්ථානය තෙක්ම දේව තාත්තාගේ දේව පරිපාලනය තමන් වහන්සේගේ ජීවිතය තුළ සිදුවන්නට ඔවුන් වහන්සේ පූර්ණ නිදහසකින් යුතුව ඉඩ දුන් සේක.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ. සෑම වචනයකම, සිදුකළ ක්‍රියාවකම තේමාව දේව රාජ්‍යය මෙලොව බිහිකිරීමයි.

ශු. ලූක් 6:20-26 (සැපත හා විපත)

ශු. ලූක් 11:2-4 (යාච්ඤා පිළිබඳ අනුශාසනා)

ශු. මාක් 10:17-25 (පොහොසත් තරුණයා)

ශු. මතෙව් 13:44-50 (ස්වර්ග රාජ්‍යය කෙතක සඟවා තිබූ නිධානයකට,
ස්වර්ග රාජ්‍යය අගනා මුතු සොයා ගිය වෙළෙන්දෙකුට,
ස්වර්ග රාජ්‍යය මුහුදේ හෙළන ලද දැලකට සමානය.)

ඔවුන් වහන්සේගේ මුළු ජීවිතයම දේව රාජ්‍යය ප්‍රකාශ වීමකි. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ දේව රාජ්‍යයම වන සේක.

**2 වන කොටස:**

**දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ සුදුසුම පුතණුවන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ**

ශු. මාක් 1:11

**"... ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වී සිටිමි'යි** පැවසීය."

**"ඔබ ගැන ප්‍රසන්නයි"** කියන වචනයේ ගැඹුරට අපි අපේ අවධානය යොමු කරද්දී එහි ගැඹුරු අර්ථය පිළිබඳව ශුද්ධාත්ම ස්නාපන රැළියේ දිව්‍ය යාගය තුළ දේශනයේදී ඇලෙක්ස් නිලන්ත පියතුමා කළ අර්ථවත් දෙසුම අප හැමගේ මතකයට නැගෙනවා නොඅනුමානය. **"ඔබ ගැන මම ප්‍රසන්නයි"** මීට යොදන ග්‍රීක වදන 'එවුදොකේසා' යන වදනයි. මේ වචනයේ මතුපිට අර්ථය කෙනෙකු ගැන ලස්සන හැඟීමක් ඇතිවන ඒ වගේම ඒ තැනැත්තා සතුටු වන ප්‍රීතිමත් තත්ත්වයක් ඇතිවීම. නමුත් එහි ගැඹුරට ගමන් කරද්දී දෙවියන් වහන්සේ පුත්‍රයාණන් වහන්සේ පිළිබඳ ඇතිකර ගත් ප්‍රසන්න අත්දැකීම කුමක්දැයි දැනගන්නට හැකිය. හුදෙක් පියාණන් වහන්සේගේ සිතෙහි පුත්‍රයාණන් වහන්සේ පිළිබඳ ඇතිවූ හැඟීමක් නොව පුත්‍රයාණන' වහන්සේගේ සුදුසුකම දෙවියන් වහන්සේට දැනුන ඇයුරු ඉන් අදහස් වෙයි. **"ඔබ තමයි මගේ රාජ්‍යය පිහිටුවන්නට සුදුසුම පුතා! ඔබ හැර එය කළ හැක කිසිවෙක් මට නැත."** ජෝර්දාන් නදියේදී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ස්නාපනය ලැබූ ඔවුන් වහන්සේ පියාණන් වහන්සේගේ සුදුසු පුතා ලෙස තම ජීවිතයේ හැම මොහොතක් ගත කළ අයුරු මුළු නව ගිවිසුම පුරාම අපට දැකගත හැකිය. ඔවුන් වහන්සේගේ වචන, ක්‍රියාවන්, බැල්ම, හැසිරීම, ජීවිත ක්‍රමය සියල්ල සුදුසු පුතා ලෙස ජීවත් වීමේ වරම ලද පුතණුවන්ගේ ප්‍රකාශනයන්මය.

ශු ලූක් 6:1-5, ශු ලූක් 9:18-20, ශු. ලූක් 11:2-5,
සුදුසු පුතා හැම මොහොතකම තාත්තා අතේ රැඳුණු සේක. දේව කැමැත්ත තම ජීවිතය තුළින් ඉටුවන්නට ඉඩ දුන් සේක.

05. අප දෙසට: සාකච්ඡාව සඳහා: (සතරදෙනාගේ පුංචි සංඝයන් තුළ)

(1) දේව රාජ්‍යය යනු ලෝකය තුළ කෙරෙන සියල්ල කෙරෙහි දෙවියන් වහන්සේගේ පාලන බලය පැවතීම නම්:

i ඔබේ මගේ ජීවිතයේ සිදුවන සෑම තත්ත්වයක් තුළම, එය මෙහෙයවන්නට, පාලනය කරන්නට දෙවියන් වහන්සේට ඉඩ දිය හැකි අවදිවීමක් අප සතුවී තිබේද?
- පෞද්ගලිකව මගේ ජීවිතය තුළ
- පවුල තුළ, සංඝය තුළ, මීසම තුළ, මගේ රට තුළ

ii මේ හැම ක්ෂේත්‍රයක් තුළම දේව රාජ්‍යයට පටහැනිව සිදුවන ක්‍රියාවන් තුළදී මගේ ප්‍රතිචාරය කුමක්ද?

iii දේව රාජ්‍යය මුළු මිනිස් සංහතිය උදෙසාමය. දිළිඳුන්, අසරණ වූවන්, කොන් වූවන් සඳහා ද දේව රාජ්‍යයේ අයිතිය ළඟාකර දෙන්නට මා පියවර ගෙන තිබේද?

iv විවිධ මතවාදයන්ට යට වෙමින් දේව රාජ්‍යයේ වටිනාකම් හෑල්ලුවට ලක්කළ අවස්ථාවන් ගැන සාකච්ඡා කරන්න. උදා: සරල අල්පේච්ච ජීවිතය, සාංඝික ජීවිතය

(2) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ අප සැම කැඳවීම ලැබුවේ දේව පුත්‍රභාවයටය. පුත්‍රභාවයේ කැඳවීම තුළද දෙවියන් වහන්සේගේ ප්‍රසන්න පුත්‍රභාවය ලබන්නට සුදුසු පුතා වන්නට විශේෂ කැඳවීමක් අප ලබා ඇත.

i අප, අප දෙස හැරී බලන විට ඇත්තටම සුදුසු පුතෙකු වෙන්නට අප සුදුසුද?

ii මගේ පැය, නිරන්තර අවදිවීම, ශු. බයිබලය කියවීම, දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරිපිට පෙනී සිටීම, දේව කැමැත්ත විමසීම මගේ ජීවිතයේ ප්‍රමුඛතාවයන්ද?

06. අවසාන යාච්ඤාව :

දේව තාත්තාගේ සුදුසු පුතෙකු ලෙස, දුවක ලෙස ජීවත් වන්නට නම් ශුද්ධාත් ස්නාපනය හැම මොහොතකම අපට අවශ්‍යය. හතරදෙනාගේ පුංචි සංඝයන් ලෙස සැකසෙමින් ස්නාපනය පතා යාච්ඤාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ...."

*************************